මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சு
MINISTRY OF FINANCE, ECONOMIC STABILIZATION AND NATIONAL POLICIES

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව
செயலகம், கொழும்பு 01, இலங்கை.
The Secretariat, Colombo 01, Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 011-2484500, 011-2484600, 011-2484700
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2449823
වෙබ් අඩවිය / இணையதளம் / Website: www.treasury.gov.lk

මගේ අංකය / எனது இல / My No: PFD/RED/REG/CIR/2023/01
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2023.05.19

රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක: 02/2023

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්

පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්

දෙපාර්තමේන්තු ප්‍රධානීන්

දිස්ත්‍රික් ලේකම්වරුන්

පළාත් පාලන ආයතන ප්‍රධානින්

රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල හා අනෙකුත් ව්‍යවස්ථාපිත ආයතන ප්‍රධානින්

**රජයේ මුද්‍රණාලයාධිපති විසින් මුද්‍රණය කරනු ලබන පොදු ආකෘතිපත්‍ර සමාලෝචනය කිරීම පිළිබඳ කමිටු වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම**

රජයේ ආයතන මගින් භාවිතයට ගන්නා, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන පොදු ආකෘතිපත්‍ර සමාලෝචනය කොට ඒවායේ භාවිතය, අවශ්‍යතාවය, කාලානුරූපී බව හා අන්තර්ගතය පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ ලබාදීම පිණිස ජනාධිපති ලේකම් විසින් පත් කළ ත්‍රිපුද්ගල කමිටුවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති ගරු අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද අමප 23/0110/604/011 දරන අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා 2023.01.30 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී අනුමැතිය හිමි වී ඇත.

02. ඒ අනුව, පහත සඳහන් වගුවේ දැක්වෙන පොදු ආකෘති පත්‍ර 30 වර්තමානයේ භාවිතයේ නොපවතින්නේ යැයි සළකා 2023.07.01 දින සිට එම ආකෘතිපත්‍ර මුද්‍රණය නොකරන ලෙස රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව වෙත දැනුම්දීමට තීරණය කර ඇත.

| | | | | | |
|---|---|---|---|---|---|
| පොදු 01 | පොදු 36 b | පොදු 71 | පොදු 90A | පොදු 91 | පොදු 92 |
| පොදු 134 | පොදු 186 | පොදු 192 | පොදු 202 | පොදු 203 | පොදු 204 |
| පොදු 205 | පොදු 206 | පොදු 207 | පොදු 208 | පොදු 220 | පොදු 221 |
| පොදු 225 | පොදු 230A | පොදු 262 | පොදු 262 A | පොදු 263 | පොදු 264 |
| පොදු 265 | පොදු 265 A | පොදු 274 | පොදු 279 | පොදු 280 | පොදු 291 |

03. එසේ වුව ද, තවදුරටත් එම ආකෘති පත්‍ර භාවිත කරන ආයතන ඇත්නම් පසුගිය ආසන්න වර්ෂ පහ තුළ රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව මගින් එම ආකෘතිපත්‍ර ලබාගත් ප්‍රමාණය හා මාසික භාවිතය (රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව මගින් ලබා ගත් මුද්‍රිත ආකෘති පත්‍ර/බාගත කරන ලද ආකෘති පත්‍ර යන දෙආකාරයෙන්ම) පිළිබඳ තොරතුරු 2023.06.15 දිනට පෙර රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ විෂය භාර මාණ්ඩලික නිලධාරියා වෙත karunarathna.hdd@pfd.treasury.gov.lk ඉ-තැපැල මගින් වාර්තා කළ යුතු බව කාරුණිකව දන්වමි.

04. තව ද, මෙතෙක් භාෂාත්‍රයෙන්ම මුද්‍රණය නොකළ (එනම් එක් භාෂාවකින් හෝ භාෂා දෙකකින් පමණක් මුද්‍රණය කළ) ආකෘතිපත්‍ර භාෂාත්‍රයෙන්ම රජයේ මුද්‍රණාල වෙබ් අඩවියේ (www.documents.gov.lk) උඩුගත කොට ප්‍රදර්ශනය කෙරෙනු ඇති අතර එම නව ආකෘති පත්‍ර උඩුගත කිරීමේ කාර්යය පියවර වශයෙන් සිදු කෙරෙනු ඇත.

05. මේ පිළිබඳව වැඩිදුර තොරතුරු අවශ්‍ය වන්නේ නම් දුරකථන අංක 011-2034508 මඟින් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ, එච්.ඩී.ඩී.පී. කරුණාරත්න මිය ඇමතිය හැකි ය.

ජේ.කේ. සෙනවිරත්න
වැඩබලන භාණ්ඩාගාර ලේකම්

පිටපත්:
01. ජනාධිපති ලේකම්
02. අග්‍රාමාත්‍ය ලේකම්
03. අමාත්‍ය මණ්ඩල ලේකම්
04. ජනමාධ්‍ය ලේකම්
05. විගණකාධිපති
06. රජයේ මුද්‍රණාලයාධිපති
07. ආයතන අධ්‍යක්ෂ ජනරාල්